**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව - 2015**

-----------------------------------------------------------

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 34 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37

කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද අයක්‍රමයකට එරෙහිව බාහිර පාර්ශවයක් විසින් පවරන ලද නඩුවක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් රු.300,000 ක නඩු ගාස්තු ගෙවා තිබූ අතර, විගණිත දිනය වූ 2016 මාර්තු මස 17 දින වන විටත් අවසන් කර නොමැති මෙම නඩුව පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 (2) (ඇ) | අතුරු අග්‍රිමයන් දෙන ලද කාර්යය නිමවූ විගසම පියවිය යුතු වුවත් 2012 වර්ෂයේ දකුණු ආසියා යටිතල පහසුකම් නියාමන සංසදයේ වැඩසටහනට ගෙවන ලද රු.55,000 ක අත්තිකාරම් මුදල 2015 දෙසැම්බර් 31 වන විටත් පියවා නොතිබුණි. |
| (ආ) | 2013 සැප්තැම්බර් 11 දිනැති අංක 02/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.3 ඡේදය | සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා සේවකයින් විසින් ගෙවිය යුතු උපයන විට ගෙවීමේ බදු රු.333,865 ක් නිලධාරියාගෙන් අයකර ගෙවීම වෙනුවට කොමිෂන් සභාව විසින් ගෙවා තිබුණි. |

### 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

බලපත්‍රලාභීන් වෙත නිකුත් කරනු ලබන විදුලි උත්පාදන බලපත්‍රයෙහි කොන්දේසි අංක 11 ප්‍රකාරව ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විදුලිබල මණ්ඩලයෙන් අයවිය යුතු එකතුව රු.81,852,700 ක වාර්ෂික නියාමන බදු මුදල් හා 2011 සිට 2015 දක්වා අනෙකුත් ආයතනවලින් අයවිය යුතු එකතුව රු.460,676 ක බදු මුදල් 2016 මාර්තු 02 දින වනවිටත් කොමිෂන් සභාවට අයවී නොතිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

**---------------------**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

**-------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,048,768 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.24,670,710 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.20,621,942 ක පිරිහීමක් නිරීක්ෂණය විය. උපදේශක සේවා ගාස්තු රු.24,667,453 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ රු.55,978,423 ක්වූ අතිරික්තය පසු වර්ෂ 04 තුලදීම පිරිහී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.4,048,768 ක් දක්වා අඩුවී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකීමේදී 2011 සිට 2015 දක්වා දායකත්වය උච්චාවචනය වී තිබූ අතර 2013 සමඟ සැසඳීමේදි 2014 දායකත්වය සියයට 36 කින් වැඩි වී තිබුණි. 2015 එය නැවතත් සියයට 13 කින් පිරිහී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**4.1** **කාර්යසාධනය**

**---------------**

2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 14 වගන්තියේ සඳහන් වන පරිදි කොමිෂන් සභාවේ අරමුණු පහත පරිදි වේ.

- සියලු පාරිභෝගිකයන්ගේ අයිතිය ආරක්ෂා කිරීම හා තරඟකාරීත්වය ප්‍රවර්ධනය

- විදුලිබල, ජලසේවා සහ ඛණිජ තෙල් යන මහජන උපයෝගිතා කර්මාන්තවල ක්‍රියාකාරීත්වය සහ ප්‍රාග්ධන ආයෝජන දෙකෙහිම කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය, ඒවායේ ආරක්ෂාකාරීත්වය සහ සේවාවල ගුණාත්මකභාවය ප්‍රවර්ධනය හා ඒවාට සම්පත් කාර්යක්ෂමව වෙන්කර දීම ප්‍රවර්ධනය

- හැකි අවස්ථාවලදී ජාත්‍යන්තර ප්‍රමිතිවලට ප්‍රතිපාර්ශ්වික උපයෝගිතා සේවා "බෙන්ච්මාර්ක්" කිරීම සහ කාර්යක්ෂමව ක්‍රියා කරන මිල පාලිත අස්ථිත්වවලට ඔවුන්ගේ මහජන උපයෝගිතා කර්මාන්ත සඳහා මුදල් සපයා ගැනීමෙහි ලා අයථා දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදු නොවන බවට වගා බලාගැනීම.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉහත පනත ප්‍රකාරව උපයෝගිතා කර්මාන්ත ලෙස දක්වා තිබූ විදුලිය, ජලය හා ඛණිජ තෙල් යන කර්මාන්තවලට අදාළ නියාමන කටයුතු සභාව විසින් සිදුකළ යුතු වුවත් ඛණිජ තෙල් හා ජලය ආශ්‍රිත කර්මාන්තවලට කොමිෂන් සභාවේ සේවය ලබාගැනීමට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන අදාළ ආයතන මගින් මෙතෙක් එකී කර්මාන්ත පිහිටුවීමේ පනත්වලට ඇතුළත් කර නොතිබුණි. එබැවින් කොමිෂන් සභාවේ සේවය විදුලිබල කර්මාන්තයට පමණක් සීමා වී තිබූ අතර ජලය හා ඛණිජ තෙල් කර්මාන්තවලට අදාළව සේවය සැපයීමේ අරමුණ ඉටුකර ගැනීමට එය බාධාවක් වී තිබුණි.

(ආ) 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබූ කාර්යයන් 07 ක් 2015 දෙසැම්බර් 31 දින වනවිටත් සම්පූර්ණ කර නොතිබුණි.

**4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

---------------------------

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නොනිමි වැඩ ලෙස දක්වා තිබූ රු.900,382 ක්වූ ව්‍යාපෘති 3 කට අදාළව කොන්ත්‍රාත්කරුවන්ගෙන් කාර්යසාධන සුරක්ෂිතයන් ලබාගෙන නොතිබුණ අතර එක් ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව හා කොන්ත්‍රාත්කරු අතර ගිවිසුමකටද එළඹ නොතිබුණි.

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 හි 9.2(ඩී) හා (ඊ) ඡේද අනුව නව කාර්ය මණ්ඩලයෙහි සංවිධාන ව්‍යුහය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට යොමු කර අනුමැතිය ලබාගත යුතු වුවද, එසේ ක්‍රියාකර නොතිබුණි.

(ආ) උක්ත (අ) හි සඳහන් චක්‍රලේඛයෙහි 9.3 ඡේදය අනුව බඳවා ගැනීම් හා උසස් කිරීම් සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(ඇ) 2011 ඔක්තෝබර් 17 දින, 2012 අගෝස්තු 09 දින හා 2014 අගෝස්තු 20 යන දිනවල පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග අනුව සේවකයන් බඳවා ගැනීම් හා කාර්ය මණ්ඩලය සඳහා වැටුප් තීරණය කිරීමේදී 2009 මැයි 26 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 39 අනුව කටයුතු කළ යුතු බවට නියෝග කර තිබුණද මෙතෙක් එපරිදි කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

--------------------------------------

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සඳහන් පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී එයට අයවැය ලේඛනය, ප්‍රසම්පාදන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම යනාදිය ඇතුළත් කර නොතිබුණි.

**5.2 අභ්‍යන්තර විගණනය**

------------------------

මුදල් රෙගුලාසි සංග්‍රහයේ 134(2) වගන්තිය ප්‍රකාරව මුදල් කටයුතුවලට අදාල අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කර නොතිබූ අතර මුදල් රෙගුලාසි 134(3) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ අයිතම් 08 ක වියදම් සඳහා සියයට 25 සිට සියයට 59 දක්වා අධි ප්‍රතිපාදනයක් පැවතීමෙන් අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6.** **පද්ධති හා පාලනයන්**

**---------------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. සේවකයන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් නොතිබීම හා වැටුප් සංශෝධන සඳහා අදාළ  චක්‍රලේඛ ප්‍රකාර අනුමැතිය ලබාගෙන නොතිබීම සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුය.